සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

**7 - ශ්‍රේණිය** 30307

සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය:- ........................................................................... කාලය: පැය 2යි.

## I කොටස

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු විරාම ලක්ෂණ යොදන්න.

1. අහා මොන තරම් රමණීය දර්ශනයක් ද
2. කොත්තමල්ලි කටුවැල්බටු පත්පාඩගම් වටිනා දේශීය ඖෂධ වර්ග කීපයකි
3. පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයට ස්වාමීන් වහන්සේට ඔබතුමාට ඔබතුමියට ආරාධනා කරමු
4. මා මෙය සිතාමතා කළ දෙයක් නොවේ ය යි හෙතෙම පැවසුවේ ය

- 5 – 8 තෙක් ප්‍රශ්නවල මුලින් දක්වා ඇති ව්‍යාකරණ වර්ගයට අයත් වන නාම පද වරහන තුළින් තෝරා ලියන්න.
(ළමයෙක්, මිනිසුන් , ඔවුහු , වඳුරා , )

5. සර්වනාම පදයකි. ......................
6. පුරුෂලිංග ඒක වචන නාම පදයකි. ..........................
7. අනුක්ත නාම පදයකි. ....................
8. අනියමාර්ථ ඒක වචන නාම පදයකි. ..........................

- පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා නැවත ලියන්න.

9. පොඩි පුතා වෙසක් පහන දල්වයි. ........................................................................
10. ගෙවිලිය සතුන්ට කෑම දමයි. ...........................................................................

- පහත දැක්වෙන්නේ ප්‍රාදේශීය ව්‍යවහාර කිහිපයකි. ඒ සඳහා පොදු ව්‍යවහාරයෙහි යෙදෙන වචන ලියන්න.

11. හනිකට .....................
12. අම්බරුවන් .................

- පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

13. මිනිරන් .................... දෙසින් විශාල හඬක් ඇසේ. (පතල, පතළ)
14. නංගිගේ .................... තුවාල විය. (දන හිස, දණ හිස )

- පහත සඳහන් වාක්‍යයන්හි ඉරි ඇඳි පද කවර ක්‍රියා වර්ගයකට අයත් දැයි ලියන්න.

දෙවියන් පුදා මෙවර විභාගයෙන් සමත් වේවා! යි මම ප්‍රාර්ථනා කළෙමි.

15. ....................................

16. ....................................

- පහත සඳහන් වචන අතරින් සඤ්ඤක අක්ෂරය සහිත වචනය තෝරා ලියන්න.
  (ශබ්දය , රඹුටන් , පහළ , පහණ )

17. ....................................

- පහත සඳහන් සිදුවීමට ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම වරහන් තුළින් තෝරා ලියන්න.

18. "දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් දැරූ උත්සාහය අපතේ ගියා" යැයි විභාග ප්‍රතිඵල දුටු පියා පැවසුවේය.
(ගඟට ඉනි කැපුවා , එක මල්ලේ ලුණු කෑවා , මුහුණු බලා කටයුතු කළා)

- සුදුසු ආඛ්‍යාත පද වරහන තුළින් තෝරා ලියන්න.

19. නුඹලා අධ්‍යාපන චාරිකාව ........................... ( යන්නෙහි ද? යන්නෙහු ද? )

20. ඔහු තම නිවෙස බලා ............................. ( ගියේය , ගියාය ) (ලකුණු 2x 20 =40)

## II කොටස

1 සහ 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) පංති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස සකස් කළ 'ලිපි එකතුවක්' ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(අ) ලිපි එකතුව සැකසීමේ දී ඔබට හෝ ඔබේ කණ්ඩායමට හෝ ලැබුණ ලිපි වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) එම ලිපි වර්ග දෙකෙහි ඇති වෙනස්කමක් ලියන්න. (ලකුණු 03)

(ඉ) ඔබට ලැබුණු ලිපි වර්ග දෙක අතරින් එක් ලිපියක මාතෘකාවක් ලියා දක්වන්න. (ලකුණු 03)

(ඊ) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(උ) ලිපි සකස් කිරීම සඳහා දැනුම ලබාගත් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)

(ලකුණු 16)

(2) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) අපේ ජනකවි

(ආ) ජල සම්පත

(ඉ) අඳුර දුරලන ගුරු දෙව්වරු

(ඊ) සොබා සොඳුරු ශ්‍රී ලංකා

(උ) මා කැමැති ජාතික වීරයා (ලකුණු 14)

(3) පොදුරාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පැවැත්වූ රචනා තරගයට ඉදිරිපත් වී ජයග්‍රහණය කළ බව පවසා ඔබේ මිතුරාට/ මිතුරියට යවන ලිපිය ලියන්න.

(ලකුණු 10)

(4) පහත සඳහන් අවස්ථාවට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"මට දරුවෝ පස්දෙනෙක් ඉන්නවා."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) ඉහත පාඨය උපුටා ගත් පාඩමේ නම කුමක් ද?

(ඉ) මෙම අවස්ථාව සඳහා යොදා ගත් තේමාව කුමක් ද?

(ඊ) මෙහි සංවිධාන කටයුතු පැවරුණේ කවුරුන් හට ද?

(උ) මෙහිදී අමුත්තන් පිළිගත් ආකාරය කෙටියෙන් ලියන්න.

(ලකුණු 2x5= 10)

(5)
සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එකවිට
දමති එරන් කැති මාරුව අහසට
කපති ගොයම් අහනෝ බැස කුඹුරට

(අ) මෙම කවියෙන් කියැවෙන්නේ කුමන අවස්ථාවක් පිළිබඳව ද? (ලකුණු 02)

(ආ) කවියේ සඳහන් උපමාව හා උපමේය වෙන් වෙන් ව ලියන්න. (ලකුණු 02)

(ඉ)
දමති එරන් කැති මාරුව අහසට
කපති ගොයම් අහනෝ බැස කුඹුරට

මෙම කවි පාද දෙක තනි වාක්‍යයක් ලෙස සකස් කර ලියන්න. (ලකුණු 03)

(ඊ) පහත දක්වා ඇති වචනවලට සමාන තේරුම් දෙන පද ඉහත කවියෙන් තෝරා ලියන්න.

(i) කෙත

(ii) නුඹ

(iii) කාන්තාවෝ (ලකුණු 03)

(6) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලිඛිත ඉතිහාසයෙනුත් ඔබ්බට යන අතීතයක් ඇති ලක්දිව පිළිබඳ ව නොයෙක් ජනප්‍රවාද සහ වෘත්තාන්ත ගෙතී ඇත්තේ ය. එහි ලිඛිත ඉතිහාසය ක්‍රි.පූ. 6 වන සියවසේ පටන් අද දක්වා අඛණ්ඩ ව පවතී. ග්‍රීසිය , රෝමය වැනි අපරදිග රාජ්‍යාවලින් ද මිසරය , අරාබිය වැනි මැදපෙරදිග දේශවලින් ද ආසන්නයේ පිහිටි භාරතයෙන් සහ ඈත පෙරදිග චීනයෙන් ද අතීතයේ පටන් ම දේශ සංචාරකයෝ ලක්දිවට ඇදී ආහ. සරතැසට පත් සංචාරකයන්ට ලක්දිව ඉතා සැපදායක පරිසරයක් ඇති බැවින් ක්ෂේම භූමියක් වූයේ ය. අශෝක ටැම් ලිපිවලින් 'තම්බපණ්ණි' නමින් ද පැරණි ග්‍රීකයන් හා රෝමවරුන් විසින් ' ටැප්‍රොබේන්' යන නමින් ද මේ දිවයින හැඳින්විණි.

(අ) මෙහි දැක්වෙන පරිදි ලිඛිත ඉතිහාසයේ ආරම්භය සිදුවන්නේ කවදා සිට ද?

(ආ) අතීතයේ දේශ සංචාරකයන් පැමිණි අපරදිග රටවල් දෙකක් නම් කරන්න.

(ඉ) අතීතයේදී වෙනත් ජාතීන් අපගේ දිවයින හඳුන්වා ඇති නම් දෙක ලියන්න.

(ඊ) ලක්දිව සංචාරකයන්ට ක්ෂේම භූමියක් බව කතුවරයා පවසන්නේ කුමන කරුණක් පදනම් කරගෙන ද?

(උ) අලිඛිත ඉතිහාසයේ තොරතුරු සොයා ගන්නට උපයෝගී කරගන්නා මාර්ග දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

(7) පහත දැක්වෙන පද්‍යය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පූලයි මමයි පලුගස් දෙබලක මැස්සේ
සයිමා සමඟ කඩියා කැටවල අස්සේ
අඳුරෙහි හැම හඩට මගෙ හදවත ගැස්සේ
කිසියම් සතෙක් නැහැ තව වැව වෙත බැස්සේ

(අ) මෙම පද්‍යයට අනුව කැටවලෙහි සිටි දෙදෙනා කවුරුන් ද?

(ආ) මෙහි සඳහන් පූලා සහ මම සිටියේ කොහේ ද?

(ඉ) මෙම සිදුවීම සිදුවන්නේ දවසේ කුමන කාලයක දී ද?

(ඊ) මෙම සිදුවීම සිදුවන්නේ කවර ස්ථානයක් අසල ද ?

(උ) මොවුන් කුමන කාර්යයක නිරත වූ බවක් හැඟේ ද? (ලකුණු 2 × 5 = 10)